මුදල් අමාත්‍යාංශය
நிதி அமைச்சு
MINISTRY OF FINANCE

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව.
செயலகம், கொழும்பு 01. இலங்கை
The Secretariat, Colombo 01. Sri Lanka

කාර්යාලය / அலுவலகம் / Office: (94)-11-2484500, (94)-11-2484600, (94)-11-2484700
ෆැක්ස් / பெக்ஸ் / Fax: (94)-11-2449823
වෙබ් අඩවිය / வெப் சைட் / Website: www.treasury.gov.lk

මගේ අංකය / எனது இல. / My No.: PE/COP/POLI/Circulars
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2016.04.29

රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 03/2016

රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව

මහා භාණ්ඩාගාරය

කොළඹ 01

සියලු ම අමාත්‍යාංශ ලේකම්වරුන්,

රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල හා රජය සතු සමාගම්වල සභාපතිවරුන් වෙත.

<u>රාජ්‍ය ව්‍යවසායයන්හි සේවකයන්ගේ උපයන විට ගෙවීම් බදු අයකර ගැනීම</u>

රාජ්‍ය ව්‍යවසායයන්හි සේවකයන් ඇතුළුව රාජ්‍ය සේවකයන්ගේ උපයන විට ගෙවීම් බදු අය කර ගැනීම සම්බන්ධයෙන් 2013 නොවැම්බර් 04 දිනැති මාගේ ලිපි අංක PF/06/35/02/01 දරණ ලිපිය කෙරේ ඔබේ අවධානය යොමු කරවමි. ඇතැම් රාජ්‍ය ව්‍යවසායයන් තවමත් සිය සේවකයන්ගේ වැටුපෙන් අඩු කර ගත යුතු උපයන විට ගෙවීම් බදු ඔවුන්ගෙන් අය නොකර එම මුදල් ආයතනයට වැය බරක් ලෙස ගෙවීම් කරන බව වාර්තා වී ඇත. මෙම කරුණ පිළිබඳ අවස්ථා ගණනාවක දී රාජ්‍ය ව්‍යවසායයන් පිළිබඳ කාරක සභාවේ දී (COPE) සාකච්ඡා වූ අතර, මෙම උපයන විට ගෙවීම් බදු අඩු කිරීම සම්බන්ධයෙන් නව උපදෙස් නිකුත් කිරීමට මා වෙත දන්වන ලදී.

02. ඒ අනුව රාජ්‍ය ව්‍යවසායයන්හි සේවකයන් විසින් ගෙවිය යුතු උපයන විට ගෙවීම් බදු සම්බන්ධයෙන් පහත සඳහන් උපදෙස් දැඩිව පිළිපැදිය යුතු ය.

**දේශීය ආදායම් දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරනු ලබන රෙගුලාසිවලට අනුකූලව බදු ගෙවිය යුතු සේවකයන්ගේ ඉපැයීම්වලින් උපයනවිට ගෙවීම් බදු අය කළ යුතුය. උපයනවිට බදු ගෙවිය යුතු සේවකයන්ගේ ඉපැයීම්වලින් එම බදු අඩු කර දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත නිසි ලෙස ප්‍රේෂණය කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය සහ ඉහළ කළමනාකාරිත්වය විසින් වගබලා ගත යුතු ය.**

03. මෙම කරුණ සම්බන්ධයෙන් යම් පැහැදිලි කිරීමක් අවශ්‍ය නම් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ බදු අර්ථ නිරූපණ කමිටුව (Tax Interpretation Committee) වෙතින් ලබා ගැනීමට කටයුතු කරන මෙන් වැඩිදුරටත් දන්වමි.

අත්/කලේ අර්.එච්.එස්. සමරතුංග

භාණ්ඩාගාර ලේකම්

පිටපත් :

1. ජනාධිපති ලේකම්
2. ලේකම්, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය
3. විගණකාධිපති
4. ලේකම්, රාජ්‍ය ව්‍යවසායයන් පිළිබඳ කාරක සභාව (COPE)
5. දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්